# අනගාරික ධර්මපාල චින්තනයේ ඇති පුද්ගල සංවර්ධනය පිළිබඳ ආකල්පය (හිනිදුම ලූවිස් කොන්දොස්තරට ලියූ ලිපි ඇසුරින්)

**එම්.කේ.ඩී. පැස්කුවල්[1]**

*[1]මාධ්‍ය ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*

**mkdpasqual@gmail.com*

අනගාරික ධර්මපාලතුමා බෞද්ධ උන්නතිකාමී පුද්ගලයෙකු ලෙස ලොව පුරා ප්‍රකටය. ධර්මපාලතුමා බුදුදහම හා සංස්කෘතිය වර්ධනයට විශාල සේවයක් සිදුකර තිබේ. බුදුදහම ඇසුරු කරගනිමින් සමාජ සංවර්ධනය, ආර්ථිකය, කර්මාන්ත දියුණුව හා බුදුදහම ප්‍රචාරය ආදිය මෙන්ම  පුද්ගල සංවර්ධනය සඳහා ද එතුමාගේ අදහස් හා මතවාද තිබේ. ගාල්ල දිස්ත්‍රික්කයට අයත් හිනිදුම ප්‍රදේශය විසිවන සියවස මුල ඉතා දුෂ්කර ප්‍රදේශයකි. වතුවගාව ව්‍යාප්තව පැවති එම වකවානුව තුළ ධර්මපාලතුමා විසින් හිනිදුමට ගොස් ඉඩම් මිලදීගෙන වතු වගාව සිදුකරන ලදී. එසේම පාසල් හා පන්සල් ඉදිකරමින් ආර්ථිකය පමණක් නොව පුද්ගල සංවර්ධනයට  අදාළ ව ක්‍රියාකර තිබේ. හිනිදුම වැනි දුෂ්කර ගමක් සංවර්ධනය සඳහා ධර්මපාලතුමාගේ ආගමනය ප්‍රධාන හේතුවක් විය. එවකට හිනිදුම විසූ ලූවිස් කොන්දොස්තර මහතා හිනිදුම වත්තේ කොන්දොස්තරවරයා ලෙස කටයුතු කර තිබේ. ධර්මපාලතුමා ඉන්දියාවේ සිර අඩස්සියේ සිටින අතරතුර (1915-1921) ලූවිස් කොන්දොස්තර මහතා සමඟ ලිපි හුවමාරු කරගෙන තිබේ. එම ලිපි වල අන්තර්ගතය විමසීම මගින් ධර්මපාලතුමා සතු ආකල්ප හා මතවාද ඉතා සරල සිංහල භාෂාවෙන් කියවා ගැනීමේ හැකියාව ලැබේ. පුද්ගලයකු සමාජගත වීමත් සංවර්ධනය ලඟා කර ගැනීමත් සඳහා ආර්ථිකය, පවුල, ආගමික නැඹුරුව හා දේශපාලන අවබෝධය පිළිබඳ දැනුවත්වීම අත්‍යවශ්‍ය තත්ත්වයක් බව මෙම ලිපි මගින් අවධාරණය කර තිබේ. විද්‍යුත් මාධ්‍ය නොමැති විසිවන සියවස මුල කාර්තුවේ ලිපි මගින් ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීමට දෙපියවර ආකෘතිය (two step model) භාවිත කළ ආකාරය ධර්මපාලතුමා ලූවිස් කොන්දොස්තරට ලියූ ලිපි අධ්‍යයනය තුළින් හෙළිදරව් වෙයි.

මුඛ්‍ය පද ඃ පුද්ගල සංවර්ධනය, දෙපියවර ආකෘතිය, වතුවගාව, සමාජ සංවර්ධනය